කොළඹ දිසා අධිකරණයේදීය.

නිහාල් ශ්‍රී අමරසේකර,

අංක.167/4, ශ්‍රී විපුලසේන මාවත,

කොළඹ 10.

පැමිණිලිකරු

නඩු අංකය: 21819/එම්.ආර්. එදිරිව

1. ගාමිණී ලක්ෂ්මන් පීරිස්,

"විදුම්සාය" ස්ටේපල්ස් වීදිය,

කොළඹ 2 සහ අංක. 37,

කිරුළ පෙදෙස, කොළඹ 05.

2. හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්,

කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය,

බාරෙ, එච්ලන් චතුරශ්‍රය, ලෝටස් පාර,

කොළඹ 01.

විත්තිකරුවන්

අති/දිසා විනිසුරු එස්.පී.ජේ.ඒකරත්න මැතිතුමා ඉදිරියේ දීය.

ලඝුලේඛිකා රේණුකා කුමාරි විසින් සටහන් කර ගන්නා ලදී.

දිසා අධිකරණය:කොළඹ.

නඩු අංකය:21819/එම්.ආර්. දිනය: 1999.02.19.

පැමිණිලිකරු සිටී. පැමිණිලිකරු වෙනුවෙන් ද සිල්වා සහ පෙරේරා නීති සමාගමේ උපදෙස් මත නීතිඥ හර්ෂ කබ්රාල් මහතා, එම්.ඒ.සුමන්තිරම් නීතිඥ මහතා, සමඟ ජනාධිපති නීතිඥ කනකේස්වරම් මහතා පෙනී සිටී.

1 වන විත්තිකරු නැත. ඔහු වෙනුවෙන් පෝල් රත්නායක නීති සමාගමේ උපදෙස් මත නීතිඥ

හර්ෂ අමරසේකර මහතා සමග ජනාධිපති
නීතිඥ රෝමේෂ් ද සිල්වා මහතා පෙනීසිටී.
2 වන විත්තිකරු නැත. ඔහු වෙනුවෙන්
නීතිඥ අර්ල්ප්‍රකාශන් මහතාගේ උපදෙස් මත
නීතිඥ යූ.ඒ.හමීන් මහතා සමග නීතිඥ ඊ.ඩී.
වික්‍රමනායක මහතා පෙනී සිටී.

අද දින මෙම නඩු කැඳවීම විභාගයට නියම කිරීම සඳහා කැඳවූ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් 1 වන විත්තිකරු විසින් මෝසමක් ඇතුලත් කර තිබූ හෙයින්, ඒ සම්බන්ධයෙන් මෙම නඩු කැඳවීම විමසීමට ගන්නා ලදී. එමෝසම පැමිණිල්ලේ නීතිඥ නැත වන ජනාධිපති නීතිඥ ඔහුගේ සේවා දායක වෙනුවෙන් කියා සිටින්නේ මෙම නඩු කැඳවීමේ 1 වන විත්තිකරු මෙම අධිකරණයේ නඩු අසන මා හොඳින් දැන සිටින අයෙකු නිසා මෙම නඩු කැඳවීම මා මා විසින්ම ඇසීමට විරුද්ධතාවයක් පළකර සිටින බවය.

මේ අවස්ථාවේ දී 2 වන විත්තිකරු වෙනුවෙන් අද දින පෙනී සිටින නීතිඥ ඊ.ඩී වික්‍රමනායක මහතා පවසා සිටින්නේ මෙම ඉහත සඳහන් කරුණු මත අධිකරණ ය විසින් නඩු කැඳවීමක් වෙනත් අධිකරණයකට මාරු කිරීම සම්පූර්ණයෙන් ප්‍රමාණවත් නැති කරුණක් බැවින් එම ඉල්ලීම ට විරුද්ධ වන බවය.

1 වන විත්තිකරු වෙනුවෙන් ජනාධිපති නීතිඥ රෝමේෂ් ද සිල්වා මහතා ප්‍රකාශ කර සිටින්නේ, ඔහුගේ සේවා දායකයාට හා ඔහුට මෙම නඩු කැඳවීම එකැම අධිකරණයක් මඟින් ඇසීමට ප්‍රශ්නයක් නොවනු ඇති බවත්

මෙම අධිකරණයේ හෝ ලංකාවේ ඕනෑම අධිකරණයක ඇසීමට විරුද්ධත්වයක් නොමැති බවය. ඔහු සහ ඔහුගේ සේවාදායකයාට ලංකාවේ සියලුම අධිකරණ කෙරෙහි සම්පූර්ණ විශ්වාසයක් ඇති බව කියා සිටී.

එනමුත් එල්ල කර ඇති චෝදනා මත ගරු විනිශ්චයකාරතුමාට පුද්ගලිකව මෙම නඩුව ඇසීමට අපහසුතාවයක් (Embarrassment) තිබේ නම් මෙම නීති කෘතිය වෙනත් අධිකරණයකට මාරු කිරීමට විරුද්ධතාවයක් නැති බවද ඔහු කියා සිටී. ඒ අකාරම මෙම නීති කෘතියේ ඉදිරිපත් කර ඇති කරුණු මත මෙම නීති කෘතිය තවත් අධිකරණයකට මාරු කිරීමට ප්‍රමාණවත් හේතු නැති බවට ඉදිරිපත් කල විරුද්ධතාවයට සම්පූර්ණයෙන් එකඟ වන බව කියා සිටී.

මේ අවස්ථාවේ 2 වන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටින නීතිඥ ජ.ඩී.වික්‍රමනායක මහතා ප්‍රකාශ කර සිටින්නේ, මෙම සිද්ධාන්තයට අද දින අලුතම මෙම නීති කෘතිය කැඳවූ අවස්ථාවේ දී, පැමිණිලිකරුගෙන් ඔහුගේ ලියාපදිංචි නීතිඥ වරයා වෙත ලැබී තිබූ එම ලිපිය විවෘත අධිකරණයට ඉදිරිපත් කර අනෙකුත් පෙනී සිටින පාර්ශවකරුවන්ගේ නීතිඥ මහත්වරුන්ට පෙන්වා එම ලිපිය නීති කෘතියට හේතු කිරීමට ඉල්ලා සිටි බවය.

එම ඉල්ලීම සම්බන්ධයෙන් ජනාධිපති නීතිඥ කනකේශ්වරන් මහතා ප්‍රකාශ කර සිටින්නේ, එම ලිපිය විවෘත අධිකරණයේ ඉදිරිපත් කලේ විනිශ්චයකාර ඉදිරියට අවුත්, අධිකරණයට පෙන්වා ඉන් අනතුරුව එහි යෝජනාව විත්තිය වෙනුවෙන් පෙනී සිටින නීතිඥ මහත්වරුන්ට ඉදිරිපත් කල බවය.

එම ලිපිය හුදෙක් ජනාධිපති නීතිඥ කනකේශ්වරන් මහතාට පමණක් යොමු කර ඇති බවත් එය අධිකරණයට භාර කිරීමත් හා හුදෙක් පදාචාරය මත,

(කර්වීරුණී -Courtesy )එම ලිපිය පෙන්වූ බවයි. එම නිසා

2 වන විත්තිකරු විසින් කර ඇති ඉල්ලීමට කනගේශ්වරන් මහතා විරුද්ධ

වේ.

නියෝගය:-

පාර්ශවකරුවන් වෙනුවෙන් නීතිඥ මහත්වරුන් විසින් ඉදිරිපත් කරන

ලද කරුණු සටහන් ගත කර, පුදුපු කටයුතු සඳහා නඩු වාර්තාව අංක. (1)

අධිකරණයට යොමු කරමි.

(එස්.පී.ජේ.ඒකරත්න)

අති/දිසා විනිසුරු: උසාවි අංක. 02.

1999.02.190

---

(10) 1999.02.24

නා:ප: (9) පරිදි කැඳවන ලදී.


මෝසම සම්බන්ධ කරුණු සහාය කිරීම.

ජනාධිපති නීතිඥ කනගේශ්වරන් මහතාගේ පුද්ගලික හේතුවක්

මත දින පතයි.

සහාය කිරීම 1999.03.15 -ප.ව. 2.15.

---




ඉහත පඳහන් වන්නේ කොළඹ දිසා අධිකරණයේ 21819/එම්.ආර්දරණ

නඩුවේ 1999.02.19 දින සිට කෘතියේ හා කාර්ය සටහන් 10 සහය පිටපතක්

(පිටු 01-04)

බව මෙයින් සහතික කරමි.

යතුරුලියනය:- Renka

සැසඳීම:- 

වත්ළුගේ
රෙජිස්ට්‍රාර්.

රෙජිස්ට්‍රාර් / ...

W/-0051503